**ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 26 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 797.10 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 752.51 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 44.59 ක් හෙවත් සියයට 5.59 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 500.36 | 495.53 | 4.83 | 0.97 |
| මූලධන | 296.74 | 256.98 | 39.76 | 13.40 |
| **එකතුව** | **797.10** | **752.51** | **44.59** | **5.59** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 21.25 | 16.67 | 11.65 | 12.44 | 60.00 | 47.34 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 29.52 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0054/000 | 0.08 |
| 6000/0000/00/0013/0026/000 | 0.50 |
| 6000/0000/00/0016/0005/000 | 28.91 |
| 6000/0000/00/0018/0006/000 | 0.03 |
| **එකතුව** | **29.52** |

**2.4 විගණන නිරීක්ෂණය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණවත් හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| (ඇ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඈ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### 3.2 විගණන සාක්ෂි නොවීම

දෙපාර්තමේන්තුවේ සංචිත වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන්, මාසික සාරාංශ වාර්තා හා අවශ්‍ය අනෙකුත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,372,123 ක ඉන්ධන වියදම්වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් දෙකකට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 8,969,303 ක් වී තිබුණි.

### 3.4 පොදු තැන්පත් ගිණුම

2015 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0016/0005/000 දරන තැන්පත් ගිණුමේ වර්ෂ 2 කට වැඩි කාලයක් සිට පැවත එමින් තිබුණු රු.4,270,072 ක් වූ තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වු සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට හිඟහිටි ණය ශේෂවල එකතුව රු. 237,860 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පාලන ගිණුම් අනුව වර්ෂයේ අවසාන හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වර්ෂයේ අවසාන හර ශේෂය අතර රු.444,761 ක වෙනසක් අනාවරණය විය. 2014 වර්ෂයේ සිට පැවත එමින් තිබුණු එම වෙනස සසඳා නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට කේවල ණය ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තුවේ ණය අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය අතර රු. 92,810 ක වෙනසක් අනාවරණය වී තිබුණි. එම වෙනස තුළ වු රු.81,405 ක් සම්බන්ධයෙන් හේතු පැහැදිලි කර නොතිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2016 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | |
| (i) | සාහිත්‍ය විශේෂ සංග්‍රහ ග්‍රන්ථ | 206 | 117,667 | වර්ෂ 03 |
| (ii) | සංගීත භාණ්ඩ | 01 | 85,833 | වර්ෂ 07 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව

2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලයේ වාර්තා පමණක් 2016 අප්‍රේල් 08 දින ඉදිරිපත් කර තිබුණි. සිංහල ශබ්දකෝෂ කාර්යාලය, විශ්වකෝෂ කාර්යාලය, කලා භවන, වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය, නිදහස් මන්දිරය, එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පර්යේෂණ ආයතනය, ජයන්ති පොත්හල හා කටුවාවල පොත් ගබඩාව යන අංශයන්හි 2016 මැයි 02 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ජාතික කලා භවනේ 2012 දෙසැම්බර් 31 දිනට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.8 බේරුම් නොකළ බැරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 1 කට අඩු කාලයක සිට පැවත එන රු. 22,404,771 ක් වූ බැරකම් විය.

(ii) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 16 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.6,985,224 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

--------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු.** | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104(1), 104(2) | 73,000 | 2001 වර්ෂයේදී කලාභවන වෙත නිකුත් කර තිබූ හා එම වර්ෂයේම අස්ථානගතවී තිබූ GT -10 ගිටාර් පැඩලයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1980 අප්‍රේල් 01 දිනැති අංක 162 දරන චක්‍රලේඛයේ 7 ඡේදය | 171,666 | රාජ්‍ය නර්තන කණ්ඩායමේ පුහුණු උපදේශක ලෙස පැමිණීම, පිටවීම හා සිදුකළ කාර්යභාරය තහවුරු කර නොගෙන මාස 7 ක් සඳහා උපදේශක දීමනා ගෙවා තිබුණි. |

**3.9 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

කලායතන ශිල්පී සංචිතය පිහිටුවීම පිළිබඳව පිළියෙල කර තිබුණු ව්‍යාපෘති වාර්තාව අනුව, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් එක් එක් දිස්ත්‍රික්කය සඳහා ශිල්පීන් 54 ක නර්තන වාදන සංචිතයක් ගොඩනැගීම එහි ප්‍රධාන අරමුණ වී තිබුණි. එමෙන්ම දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් ශිල්පීන්ගෙන් සැදුම්ලත් 100 ක ජාතික නර්තන සංචිතයක් ගොඩනැගීමද අරමුණු කරගෙන තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 3 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, ජාතික කලා භවනට අනුයුක්ත 54 ක් හා මහනුවර ජාතික කලා නිකේතනයට සම්බන්ධ ශිල්පීන් 45 ක සංචිත පමණක් පිහිටුවා තිබු අතර දිස්ත්‍රික් මට්ටමින් ශිල්පීන් 1000 ක් ඇතුළත් නර්තන සංචිතය 2016 මැයි 30 දින වනවිටත් පිහිටුවා නොතිබුණි.

**3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති iii වන පරිච්ඡේදයේ 27 වගන්තියට පටහැනිව අනුමත සේවක සංඛ්‍යාව තුළ ඇතුළත් නොවූ පුහුණු උපදේශක තනතුරක් සඳහා බඳවා ගත් පුද්ගලයෙකුට 2014 දෙසැම්බර් මාසයේ සිට 2015 ජූනි මාසය දක්වා කාලය තුළ රු.171,666 ක් ගෙවා තිබුණි.

(ආ) යථෝක්ත පටිපාටික රීති 1 කාණ්ඩයේ 02 වන පරිශිෂ්ටය ප්‍රකාරව පත්කිරීම සඳහා විධිමත් පත්වීම් ලිපියක්ද ලබාදී නොතිබුණි.

**3.11 අවිධිමත් ගනුදෙනු**

----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු වල අධිකාරී බලයක් නොමැතිව සිදුකර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) බාහිර පාර්ශවයන් විසින් සංවිධානය කර 2014 දෙසැම්බර් 26 දින සිට 30 දින දක්වා පවත්වන ලද වැඩසටහන් 05 ක් සඳහා එක් වැඩසටහනකට ගායන ශිල්පීන් 04 දෙනෙකු බැගින් සහභාගි කරගෙන තිබුණි. විධිමත් අනුමැතියකින් තොරව එක් ශිල්පියෙකුට එක් වැඩසටහනක් සඳහා රු.10,000 බැගින් රු.200,000 ක් හා සංග්‍රහ වියදම් වෙනුවෙන් රු. 43,870 ක් වශයෙන් එකතුව රු. 243,870 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 1.1 හා 1.2 වගන්ති ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන දෙපාර්තමේන්තු ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නිලධාරින් පස් දෙනෙකු නර්තන ශිල්පී සංචිතයේ උපදේශකවරුන් ලෙස සේවයේ යොදවා තිබුණි. 2013 වර්ෂයේදී රු.216,000 ක් ද, 2014 වර්ෂයේදී රු.351,000 ක් ද, 2015 වර්ෂයේදී රු.99,000 ක් ද වශයෙන් උපදේශක දීමනා එම නිලධාරින් පස්දෙනාට ගෙවා තිබුණි.

**3.12 මුල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

-------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මහා වංශ කාර්යාලයේ සම්පාදක මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් දීමනා හා සංග්‍රහ කටයුතුවලට ලබාගත් රු.70,000 ක අත්තිකාරම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික ගිණුමට බැරකිරීමට මහාවංශ කාර්යාලයේ සම්බන්ධීකාරක විසින් කටයුතු කර තිබුණි.

(ආ) මහා වංශ කාර්යාලයේ සාමාජිකයින්ට දීමනා ගෙවීම දෙපාර්තමේන්තුවේ සරප් විසින් හෝ එතුමාගේ නමට ලියන ලද චෙක්පත් මඟින් කළයුතුව තිබුණි. නමුත් එම දීමනා මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව මහා වංශ කාර්යාලයේ සම්බන්ධීකාරක වෙත තත්කාර්ය අතුරු අග්‍රිම මගින් ගෙවා තිබුණි. නිලධාරියා විසින් එම අත්තිකාරම් පියවීමේදී රු.32,000 ක් සඳහා ව්‍යාජ බිල්පත් මගින් ද, රු. 28,000 ක් රැස්වීම්වලට සහභාගි වූ සාමාජිකයන්ගේ නම් ඇතුළත් කර ව්‍යාජ අත්සන් යොදා නම් ලැයිස්තුවෙන්ද පියවා තිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 14 | 12 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 524 | 481 | 43 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 87 | 74 | 13 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම මත) | 82 | 43 | 49 | 10 |
| | **එකතුව** | **722** | **614** | **118** | **10** |